# ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය

## උසස් අධ්‍යාපනයේ පෙර ගමන්කරු සමග එක්වන්න

# උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ පාලක සභාව මගින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 34(1) වගන්තිය ප්‍රකාරව හා ඉන් පසු සංශෝධන සහ 2023/03 දරන කොමිෂන් සභා චක්‍රලේඛයේ නියමයන් හා කොන්දේසි අනුව උපකුලපති තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ විධිවිධාන යටතේ උපකුලපතිවරයා පූර්ණකාලීන නිලධාරියකු වන අතර, ඔහු/ ඇය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන අධ්‍යයන නිලධාරියා සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා ද වේ. ඔහු/ ඇය නිල බලයෙන්ම පාලක සභාවේ සහ සනාතන සභාවේ සාමාජිකයකු සහ සභාපතිවද වන්නේය.

උපකුලපතිවරයා, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත ප්‍රකාරව ඔහු/ ඇය කලින් ධුරයෙන් ඉවත් වන්නේ නම් හෝ තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, වසර තුනක කාලයක් හෝ ඔහුගේ / ඇයගේ වයස හැටපහ සම්පූර්ණ දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා තනතුර දැරිය යුතුය.

විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු මෙහෙයවීම, කළමනාකරණ ප්‍රතිපත්ති මෙහෙයවීම හා හඳුන්වාදීම, පාලක සභාවේ තීරණය ක්‍රියාත්මක කිරීම සහ විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය පරිපාලනය මෙහෙයවීම උපකුලපතිවරයාගේ වගකීම වේ. ඔහු/ඇය අධ්‍යයන විශිෂ්ටත්වය, විනිවිදභාවය, වගකිව යුතු බව , ප්‍රජාතන්ත්‍රවාදී කළමනාකරණය සහ ඵලදායී අපක්ෂපාති නායකත්වය යන මූලධර්ම ආරක්ෂා කළ යුතුය.

සාර්ථක අයදුම්කරු සතුව පුළුල් පර්යේෂණ පැතිකඩක්, විශිෂ්ට නායකත්ව ගුණාංග සහ විවිධ පුද්ගල කණ්ඩායම් සමග සාර්ථකව කටයුතු කළ හැකි අන්තර් පුද්ගල පෞර්ෂයක්, ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහ තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හැකියාවද, ඇතුළුව ඉහළ අධ්‍යයන සුදුසුකම් සපුරාලිය යුතුය. ඔහු/ ඇය සතුව ප්‍රජාව සඳහා කැපවීමද ඇතුළුව විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්ති සහ විශ්වවිද්‍යාලයේ මෙහෙවර පිළිබඳ ගැඹුරු අවබෝධයක් ද තිබිය යුතුය. (පහත දැක්වෙන විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන http:www.rjt.ac.lk/news/?cat=2 මගින් වැඩිදුර තොරතුරු අදාළ අයදුම්කරුවන්ට/ නම් කළ අයට ආයාචනා කෙරේ)

විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ඉහළම අධ්‍යයන වැටුපද, මූලික වැටුපෙන් 15% ක සංග්‍රහ දීමනාවක්ද, සන්නිවේදන දීමනාවක්ද, ඉන්ධන දීමනාවක්ද ආදියද උපකුලපතිවරයාට හිමිකම් ලැබේ. ඊට අමතරව උපකුලපතිවරයාට රියදුරු සහිතව නිල වාහනයක් හා උපකුලපතිවරුන්ගේ නිවාස ක්‍රමයෙහි තිබෙන සියලූ පහසුකම් සහ සේවාවන් සහිත නිවසක්ද, ලැබීමට හිමිකම් තිබේ.

**අයදුම්පත් සමග පහත ලිපිලේඛන ද එවිය යුතුය.**

i උපන්දිනයද සහිත අයදුම්කරුගේ සම්පූර්ණ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ ලේඛන (අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙක් වියයුතු අතර, අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 63 ට වඩා අඩු විය යුතුය) කරුණාකර උප්පැන්න සහතිකයේ පිටපතක් හා හැඳුනුම්පතෙහි පිටපතක් අමුණන්න.

ii. විශ්වවිද්‍යාල සංවර්ධනය උදෙසා දැක්ම පිළිබඳ පුද්ගලික ප්‍රකාශයක් සහ උපකුලපති තනතුරට පත්කරනු ලැබුවහොත් අයදුම්කරු විසින් ළඟාකර ගැනීමට අපේක්ෂිත ජයග්‍රහණ සම්බන්ධ කෙටි හැඳින්වීමක්.

iii. වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු නම් හෝ මීට පෙර මෙම විශ්වවිද්‍යාලයේ උපකුලපති ධුරය හෙබවූ අයෙක් නම්, ඉහත (II ඡේදය) හි සඳහන් ලේඛනවලට අමතරව ඔහුගේ/ ඇයගේ පළමු නිල කාලය තුළ සිදුකළ ජයග්‍රහන ඉස්මතු කරවන වාර්තාවක් ලබාදිය යුතුය.

iv. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය හැර වෙනත් රාජ්‍ය සේවයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන හෝ උසස් අධ්‍යාපන ආයතනවල සේවය කරන අයදුම්කරුවෙකු විසින් තම සේවායෝජක වෙතින් අයදුම්කරු මෙම තනතුරට තෝරාගතහොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණ සඳහන් කරමින් ලිපියක් ලබාගෙන ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පත් ලේඛකාධිකාරී/පාලක සභා ලේකම්, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, ලේඛකාධිකාරී කාර්යාලය වෙත ඕනෑම රාජකාරි දිනයකදී, 2025.04.09 දින ප.ව. 3.30ට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ අයදුම්පත් බහාලූ ලිපිකවරයේ වම්පස ඉහළ කෙළවරේ **"උපකුලපති තනතුර"** ලෙස සඳහන් කළ යුතුය.

ඊට අමතරව, අයදුම්පත්‍රයේ මෘදු පිටපතක් හා අදාළ අනෙකුත් ලේඛනවල PDF ආකෘතියෙන් registrar@rjt.ac.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට ඉහත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය.

අදාළ අයදුම්පත්‍ර භාරගැනීමේ අවසන් දිනයෙන් පසු මාස දෙකක් ඇතුළත රාජකාරි දිනයක විශේෂ පාලක සභා රැස්වීමක් කැඳවනු ලබන අතර, ඇගයීම් හා සම්මුඛ පරීක්ෂණය සඳහා විශේෂ පාලක සභා රැස්වීමට පෙර අයදුම්කරුවන් පෞද්ගලිකව කැඳවනු ලැබේ. සියලූ අයදුම්කරුවන්ට අවම වශයෙන් විනාඩි දහයක (10) කාලසීමාවක කෙටි ඉදිරිපත් කිරීමක් කරන ලෙස ඉල්ලා සිටින අතර, එය විනාඩි පහළොවක් (15) නොඉක්මවිය යුතුය. කිසියම් අයදුම්කරුවෙකු අසනීපයක් හේතුවෙන් හෝ විදේශගතව සිටීම හේතුවෙන් විශේෂ පාලක සභා රැස්වීමට පෞද්ගලිකව පෙනී සිටීමට හැකියාවක් නොමැති නම් ඔහු/ ඇය ලේකම්වරයා වෙත පූර්ව දැනුම් දීමක් සහිතව දුරස්ථ වීඩියෝ සම්මන්ත්‍රණ මාධ්‍යයෙන් පෙනී සිටීමට අවසර දෙනු ලැබේ.

අදාළ තෝරා ගැනීම්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2023.04.10 දිනැති අංක 03/2023 දරන චක්‍රලේඛයේ දක්වා ඇති ක්‍රමවේදය අනුගමනය කිරීමෙන් සිදුකරනු ලැබේ. අදාළ උපකුලපති තනතුරට පත්කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වැඩි විස්තර සඳහා කරුණාකර ඉහත චක්‍රලේඛ වෙත යොමු වන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

අදාළ භාරගනු ලබන අවසන් දිනය හා වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සළකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී හා පාලක සභා ලේකම්,**
**ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.**
**2025.03.09**